## III. මහ බැංකු ගිණුම් සහ ගනුදෙනු

1961 වර්ෂයේ මහ බැංකුවේ මූල්‍ය ගිණුම් 2 වැනි පරිශිෂ්ටයෙහි 6 වැනි සටහනෙහි දක්වා ඇත. 1959 හා සැසැඳීමේ දී දක්නට ලැබුණු ප්‍රධාන වෙනස්වීම් පහත දැක්වේ.

| | වෙනස්වීම් | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම .. .. .. .. .. .. | + 52·1 | + 6·5 |
| නෝට්ටු හා කාසි සංසරණය .. .. .. .. .. | + 23·3 | + 3·7 |
| ඉල්ලුම් තැන්පතු .. .. .. .. .. .. .. | + 28·8 | + 15·9 |
| (එයින් වෙළෙඳ බැංකු) .. .. .. .. .. | + 44·9 | + 47·1 |
| ජාත්‍යන්තර සංචිතය .. .. .. .. .. .. | —196·5 | — 50·8 |
| දේශීය වත්කම් .. .. .. .. .. .. .. | +267·2 | + 52·0 |
| රජයේ සහ රජය සහතික කළ ණයපත් .. .. .. | +224.3 | + 65·1 |

\+ වැඩිවීම

—අඩුවීම

1959 අවසානයේ සියයට 48·2 ක් ව පැවැති නෝට්ටු කාසි සහ ඉල්ලුම් වගකීම්වල ජාත්‍යන්තර සංචිතයේ අනුපාතය, 1960 අවසානය වන විට සියයට 22·2 දක්වා අඩු විය.

රන්පවුම්–ඩොලර් ගාස්තු වෙනස්වීම්වලට අනුරූපව ඇමෙරිකානු ඩොලරයක මහ බැංකු ගාස්තුව (i (ආ) (ix) පරිශිෂ්ටයෙහි දක්වා ඇති පරිදි) කලින් කලට වෙනස් විය.

පහත දක්වා ඇති පරිදි අවුරුද්ද තුල රන් පවුමෙහි සහ ඉන්දීය රුපියලෙහි මහ බැංකු ගාස්තුවේ වෙනසක් ඇති නො වුණි.

| | | විදුලි පණිවුඩ මගින් මිල දී ගැනීම | විදුලි පණිවුඩ මගින් විකිණීම |
|---|---|---|---|
| රන් පවුම | .. එතැන් | .. සි. 1 පැ. 6 3/64 | .. සි. 1 පැ. 6 1/32 |
| (ලංකාවේ රුපියලකට).. | ඉදිරි | .. මසක වට්ටම් මිල | .. මසක අධික මිල |
| | (හය මාසයක් දක්වා).. | පැන්ස 1/128 | .. පැන්ස 1/128. |
| ඉන්දියානු රුපියල් | .. එතැන් | .. රු. 99 3/4 | .. රු. 99 13/16 |
| (සියයට) | .. ඉදිරි | .. මසක වට්ටම් මිල | .. මසක අධික මිල |
| | (හය මාසයක් දක්වා).. | රුපියලෙන් 1/32 | .. රුපියලෙන් 1/32 |

මහ බැංකුවේ සම්පූර්ණ විදේශීය මුදල් ගනුදෙනු 10 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ. එතැන් මිලදී ගැනුම් රුපියල් කෝටි 16·23 ක් වූ අතර එතැන් විකුණුම් රුපියල් කෝටි 49·87 ක් විය. මෙය 1959 වර්ෂයේ දී රුපියල් කෝටි 17·09 ක් සහ රුපියල් කෝටි 49·59 ක් විය. ඉදිරි මිල දී ගැනුම් සඳහා බැඳුන ගිවිසුම්වල වටිනාකම රුපියල් කෝටි 21·85 ක් විය. (1959 දී රුපියල් කෝටි 21·83 ක් විය.) ඉදිරි විකුණුම් සඳහා බැඳුන ගිවිසුම්වල වටිනාකම රුපියල් කෝටි 14·25 ක් විය. (1959 දී රුපියල් කෝටි 5·24 ක් විය.) ඉදිරි මිලදී ගැනුම් ගිවිසුම් යටතේ ගත වූ අවුරුද්දේ ඉතිරිව තිබූ මුදල් ද සමග රුපියල් කෝටි 24·04 ක් ලැබුණු අතර ඉදිරි විකුණුම් ගිවිසුම් අනුව විකුණූ ප්‍රමාණය රුපියල් කෝටි 11·11 ක් විය. මිල දී ගත් මුළු ප්‍රමාණය (ඉදිරි ගිවිසුම් යටතේ එතැන්හි ලැබුණු) රුපියල් කෝටි 40·27 ක් වූ අතර, විකිණි මුළු ප්‍රමාණය රුපියල් කෝටි 60·98 ක් විය.

#### ආදායම සහ වියදම

වර්ෂයේ මහ බැංකු ආදායම රුපියල් 2,17,84,739·66 ක් වූ අතර මුදල් පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර සංචිත සඳහා වෙන් කරන ලද රුපියල් 1,11,80,360·01 ඇතුලුව වර්ෂයේ මහ බැංකු වියදම රුපියල් 1,97,84,739·66 ක් විය. ශුද්ධ ලාභය වූ රුපියල් 20,00,000 මුදල් පනතේ 39 (ආ) වගන්ති ප්‍රකාර අතිරික්තයට බැර කරන ලදී. මෙසේ කරන ලද්දේ 1960 දෙසැම්බර් මාසයේ අවසානයේ දී මහ බැංකුවේ ප්‍රාග් ධන ගිණුම්හි එකතුව, සම්පූර්ණ බැංකු වත්කම් අතර, සහ එහි විදේශීය මුදලින් ඇති වත්කම්හිත් වෙන සින් සියයට 15 කට වඩා අඩු වූ නිසාය. දැනට අතිරික්තය රුපියල් කෝටි 2·50 ක් ව පවතී.

#### බැංකු පරිපාලනය

1960 වර්ෂයේ දී, මුදල් නීති පනතේ 29 (i) වගන්ති ප්‍රකාර බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳ බැංකු 12 ක් ද මුදල් නීති පනතේ 29 (2) වැනි වගන්ති ප්‍රකාර මුදල් මණ්ඩලයේ විධානයකට අනුව වෙළෙඳ බැංකුවක් නොවන එක් බැංකු ආයතනයක් ද පරීක්ෂා කර බලන ලදී.

1955 සිට පනතේ 29 (6) වැනි වගන්තිය යටතේ නියම කරන ලද පරීක්ෂණ කාල සීමාව, සෑම ලිත් වර්ෂයකම මැයි 1 වැනි දින පටන් ගෙන ඊළඟ අවුරුද්දේ අප්‍රේල් 30 වැනි දින අවසන් වේ. 1960 දී මුදල් මණ්ඩලය විසින් පරීක්ෂණ කාල සීමාව වෙනස් කරන ලදී. ඊට අනුව 1959/60 කාල සීමාව 1960 අග දක්වා ද 61–1–1 වැනි දින සිට ඉදිරියට පරීක්ෂණ කාල සීමාව අවුරුදු දෙකක් වන ලෙස ද දික් කරන ලදී.

1957 අංක 42 දරන බැංකු භර බඳු පනත ක්‍රියාත්මක කිරීමෙහිලා සමහර කාර්ය යන් දෙපාර්තමේන්තුව විසින් කර ගෙන යන ලදී.